දීමනාපත්‍ර ඉඩමක ජීවිත භුක්ති අයිතිය ලබාගැනීමට කළයුතු දේ

- ✓ දීමනාපත්‍ර ඉඩමක දීමනාපත්‍රකරු මිය ගිය විට පසු අයිතිකරුවෙකු නම්කර තිබුණත් නැතත් දීමනාපත්‍රකරු විවාහක නම් එම දීමනාපත්‍රකරුගේ බිරිඳට හෝ සැමියාට (කලත්‍රයාට) එම ඉඩමෙහි ජීවිත භුක්තිය හිමි වේ.

- ✓ ජීවිත භුක්තිය ලබාගැනීම සඳහා පහත ලේඛන සමඟ ඉඩම් හිමිකරු මිය ගොස් මාස 06 ක් ඉකුත්වීමට පෙර ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හමුවන්න.

- ❖ ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ලිපිය
- ❖ දීමනාපත්‍රය හා දීමනාපත්‍රයේ සහතික කළ පිටපත
- ❖ දීමනාපත්‍රයට අදාල මෑතකදී ලබාගත් සියලුම පත්ඉරු (මුල් ප්‍රදානපත්‍රෙය් සිට මේ දක්වා)
- ❖ දීමනාපත්‍රකරුගේ මරණ සහතිකය
- ❖ දීමනාපත්‍රකරුගේ විවාහ සහතිකය හෝ දරුවකුගේ උප්පැන්න සහතිකය
- ❖ ග්‍රාම නිලධාරි නිර්දේශය

  - ➢ ඉඩම් හිමිකරු වූ බිරිඳ/ සැමියා මිය යාමෙන් පසුව ඔබ යළි විවාහ වුවහොත් එම ඉඩම සඳහා වූ ජීවිත භුක්ති අයිතිය අහෝසි වේ.